# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2391/29 – 2024 ජුලි මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2024.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි ( සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 මැයි මස 29 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා. ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජුලි මස 02 දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල.


1A – G 042166 – 19 (2024/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය ( සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම 2024 ජුලි මස 02 දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 ජුලි මස 04 දින.
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
''සෙත්සිරිපාය'' අදියර - II,
බත්තරමුල්ල.

## හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව හැටන් දික්ඔය නගර සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සහ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 ජුලි මස 02 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2024 ජුලි මස 04 දින.

EOG 07 - 0038

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.